# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2327/05 - 2023 අප්‍රේල් මස 11 වැනි අඟහරුවාදා - 2023.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පුපුරන ද්‍රව්‍ය ආඥාපනත (සංශෝධන)

1956 අංක 21 දරන පුපුරන ද්‍රව්‍ය ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මා විසින් සාදන ලද නියෝග.

රනිල් වික්‍රමසිංහ,
ආරක්ෂක අමාත්‍ය.

2023 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

**(01) කොටස**

(01). 2016 සැප්තැම්බර් මස 23 දින ප්‍රකාශිත අංක 1985/37 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් සංශෝධිත, අංක 23/5 දරන 1979.02.13 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද, 1979 පුපුරන ද්‍රව්‍ය නියෝගවල සඳහන් පස්වන උපලේඛනය වෙනුවට පහත දැක්වෙන නව උපලේඛනය ඇතුලත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

1A - G 39320 — 07 (2023/04)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*පස්වන උපලේඛනය*

**බලපත්‍ර හා අවසරපත්‍ර ගාස්තු**

| *අ/අ* | *I තීරය* | *II තීරය* |
|---|---|---|
| 1 | පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදකයෙකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා වූ බලපත්‍රය | |
| | (අ). ගල් වෙඩි බෙහෙත් නිෂ්පාදනය සඳහා පමණක් | රු. 4,000.00 |
| | (ආ). ආරක්ෂිත සේවා නූල් නිෂ්පාදනය සඳහා පමණක් | රු. 7,000.00 |
| | (ඇ). ගල් වෙඩි බෙහෙත් හා ආරක්ෂිත සේවා නූල් යන දෙවර්ගයම නිෂ්පාදනය සඳහා | රු. 10,000.00 |
| | (ඉ). වෝටර් ජෙල් නිෂ්පාදනය සඳහා පමණක් | රු. 50,000.00 |
| | (ඊ). එමල්ෂන් පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පමණක් | රු. 25,000.00 |
| | (උ). අනෙකුත් පුපුරන ද්‍රව්‍ය: | |
| | I. කි.ග්‍රෑ. 12,000 නොඉක්මවන ප්‍රමාණයන් සඳහා | රු. 2,000.00 |
| | II. කි.ග්‍රෑ. 60,000 නොඉක්මවන ප්‍රමාණයන් සඳහා | රු. 4,000.00 |
| | III. කි.ග්‍රෑ. 60,000ට වැඩි ප්‍රමාණයන් සඳහා | රු. 8,000.00 |
| 2 | පුපුරන ද්‍රව්‍ය ආනයනකරුවකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා වන බලපත්‍රය | |
| | (අ). වාණිජ කාර්යයන් සඳහා ආනයනය කිරීම: | |
| | I. මෙට්‍රික් ටොන් 50 නොඉක්මවන ප්‍රමාණයන් සඳහා | රු. 15,000.00 |
| | II. මෙට්‍රික් ටොන් 50 වැඩි මෙට්‍රික් ටොන් 200 අඩු ප්‍රමාණයන් සඳහා | රු. 40,000.00 |
| | III. මෙට්‍රික් ටොන් 200ට වඩා වැඩි ප්‍රමාණයන් සඳහා | රු. 75,000.00 |
| | (ආ). වෛද්‍ය හෝ පර්යේෂණ කාර්යයන් සඳහා ආනයනය කිරීම | රු. 6,000.00 |
| 3 | පුපුරන ද්‍රව්‍ය සපයන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා වන බලපත්‍රය | |
| | (අ). ගිනිකෙළි භාණ්ඩ සඳහා පමණක්: | |
| | I. කි.ග්‍රෑ. 250 නොඉක්මවන ප්‍රමාණ සඳහා | රු. 1,000.00 |
| | II. කි.ග්‍රෑ. 250ට වැඩි කි.ග්‍රෑ. 12,000 නොඉක්මවන ප්‍රමාණ සඳහා | රු. 2,000.00 |
| | III. කි.ග්‍රෑ. 12,000ට වැඩි කි.ග්‍රෑ. 60,000 නොඉක්මවන ප්‍රමාණ සඳහා | රු. 3,000.00 |
| | IV. කි.ග්‍රෑ. 60,000 වැඩි ප්‍රමාණ සඳහා | රු. 8,000.00 |
| | (ආ). වෙනත් පුපුරන ද්‍රව්‍ය සඳහා: | |
| | I. මෙ.ටො. 120 නොඉක්මවන ප්‍රමාණ සඳහා | රු. 20,000.00 |
| | II. මෙ.ටො. 300 නොඉක්මවන ප්‍රමාණ සඳහා | රු. 40,000.00 |
| | III. මෙ.ටො. 300ට වැඩි ප්‍රමාණ සඳහා | රු. 100,000.00 |

| අ/අ | I තීරය | II තීරය |
|---|---|---|
| 4 | පුපුරන ද්‍රව්‍ය අත්කරගැනීම සන්තකයේ තබා ගැනීම සහ පාවිච්චි කිරීම සඳහා වන අවසර පත්‍රය | |
| | (අ). පෞද්ගලික පාවිච්චිය සඳහා: | |
| | I. කි.ග්‍රෑම්. 100ට අඩු ප්‍රමාණ සඳහා | රු. 500.00 |
| | II. කි.ග්‍රෑම්. 100ට වැඩි ප්‍රමාණ සඳහා | රු. 1,000.00 |
| | (ආ). වාණිජ කටයුතු සඳහා: | |
| | කි.ග්‍රෑම්. 1000ට අඩු ප්‍රමාණ සඳහා | රු. 2,000.00 |
| | කි.ග්‍රෑම්. 1000ට වැඩි කි.ග්‍රෑම් 4000 නොඉක්මවන ප්‍රමාණ සඳහා | රු. 4,000.00 |
| | කි.ග්‍රෑම්. 4000ට වැඩි කි.ග්‍රෑම් 40,000 නොඉක්මවන ප්‍රමාණ සඳහා | රු. 8,000.00 |
| | කි.ග්‍රෑම් 40,000ට වැඩි ප්‍රමාණ සඳහා | රු. 20,000.00 |
| 5 | පුපුරන ද්‍රව්‍ය අපනයනකරුවකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා වන බලපත්‍රය | රු. 2,500.00 |
| 6 | නැති වූ හෝ විනාශ වූ සෑම බලපත්‍ර හෝ අවසරපත්‍ර පිටපත් සඳහා | අදාළ බලපත්‍ර/ අවසරපත්‍ර ගාස්තුවෙන් 60% |
| 7 | පුපුරන ද්‍රව්‍ය ආනයනය කිරීම, අපනයනය කිරීම, සන්තකයේ තබා ගැනීම සහ පාවිච්චි කිරීම සඳහා වන අවසර පත්‍ර | රු. 4,000.00 |

(02). බර අනුව දක්වා නොමැති පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණයන් තීරණය කිරීම සඳහා වන තුල්‍යතා චක්‍රය

(අ) සේවා නූල් මීටර් 500ක ප්‍රමාණයන් කි.ග්‍රෑ. එකක් ලෙස සැලකිය යුතුය.

(ආ) ඩෙටෝනේටර්ස් ගණනින් 500ක ප්‍රමාණයක් කි.ග්‍රෑම්. එකක් ලෙස සැලකිය යුතුය.

(ඇ) ඩෙටෝනේටින් කෝඩ් මීටර් 500ක ප්‍රමාණයක් කි.ග්‍රෑම්. එකක් ලෙස සැලකිය යුතුය.

(ඈ) පතරොම් ගණනින් 250ක ප්‍රමාණයක් කි.ග්‍රෑ. එකක් ලෙස සැලකිය යුතුය.

**(02). කොටස**

(03). 2021 දෙසැම්බර් මස 08 වැනි දින ප්‍රකාශිත අංක 2257/32 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් සංශෝධිත, අංක 23/5 දරන 1979.02.13 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද, 1979 පුපුරන ද්‍රව්‍ය නියෝගවල සඳහන් පස්වන උපලේඛනයේ සඳහන් අන්තරායකාරී නෞකා භාණ්ඩ නිෂ්කාශන සඳහා අවසර පත්‍ර සඳහා වූ අදාළ ගාස්තු සඳහන් වන උපලේඛනය වෙනුවට පහත දැක්වෙන නව උපලේඛනය ඇතුලත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ

*පස්වන උපලේඛනය*

**බලපත්‍ර හා අවසරපත්‍ර ගාස්තු**

| *අ/අ* | *අන්තරායකාරී නොවා භාණ්ඩ නිෂ්කාශන අවස්ථා* | *අදාළ අවසර පත්‍ර ගාස්තුව රුපියල්* |
|---|---|---|
| 1 | (නාවික හා ගුවන්) නිෂ්කාශන නියෝජිතයන් සඳහා ඉවත් කිරීමේ අවසරපත්‍ර (Discharge) | රු. 20,000.00 |
| 2 | (නාවික හා ගුවන්) නිෂ්කාශන නියෝජිතයන් සඳහා ඉවත් කිරීමේ හා නැව්ගත කිරීමේ අවසරපත්‍ර (Transshipment) | රු. 20,000.00 |
| 3 | (නාවික හා ගුවන්) නිෂ්කාශන නියෝජිතයන් සඳහා අන්තර් ප්‍රවාහන අවසරපත්‍ර (In transit) | රු. 20,000.00 |
| 4 | (නාවික හා ගුවන්) නිෂ්කාශනය සඳහා අවසරපත්‍ර (Clearance) | රු. 20,000.00 |

**(03). කොටස**

(04). 2022 මාර්තු මස 02 වැනි දින ප්‍රකාශිත අංක 2269/33 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් සංශෝධිත, අංක 23/5 දරන 1979.02.13 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද, 1979 පුපුරන ද්‍රව්‍ය නියෝගවල සඳහන් පස්වන උපලේඛනයේ සඳහන් අන්තරායකාරී නොවා භාණ්ඩ නිෂ්කාශන සඳහා අවසර පත්‍ර සඳහා වූ අදාළ ගාස්තු අයකිරීමේ අනු අංක 5 මගින් ප්‍රකාශිත, "ගිනි අවි සමඟ ශ්‍රී ලංකා මුහුදු තීරයට ඇතුළුවන නැව් සඳහා අවසර පත්‍ර ගාස්තුව" සඳහන් වන උපලේඛනය වෙනුවට පහත දැක්වෙන නව උපලේඛනය ඇතුලත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ

*පස්වන උපලේඛනය*

**බලපත්‍ර හා අවසරපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| 5 | ගිනි අවි සමඟ ශ්‍රී ලංකාවේ දේශීය මුහුදු තීරයට හෝ අභ්‍යන්තර ජල තීරයට (ගොඩබිම සිට නාවික සැතපුම් 12 දක්වා වූ කලාපයට හෝ ශ්‍රී ලංකාවේ වරායවල් හෝ ඉන්දු- ශ්‍රී ලංකා ජාත්‍යන්තර සමුද්‍ර මායිම් රේඛාවට ඇතුළතින් වූ ශ්‍රී ලංකාවට අයත් වූ කලාපය) ඇතුළු වන නැව්/ යාත්‍රා සහ ගිනිඅවි පටවා ගැනීමේ අරමුණින් ඉහත සඳහන් කලාපයන් වෙත ඇතුළු වන නැව්/ යාත්‍රා සඳහා අවසර පත්‍ර ගාස්තුව | රු. 20,000.00 |

(05). ඉහත සඳහන් සංශෝධන නියමයන් 2023 මැයි මස 01වැනි දින සිට ක්‍රියාත්මක විය යුතුය.

EOG 04 -0079

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.